**කොන්ක්‍රීට් කණුමත දිවෙන (Elevated) වරාය ප්‍රවේශ මාර්ග ව්‍යාපෘතිය - 2017**

---

කොන්ක්‍රීට් කණුමත දිවෙන වරාය ප්‍රවේශ මාර්ග ව්‍යාපෘතියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

**1.2** <u>**ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය.**</u>

උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය හා මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන ලෙස සමාලෝචිත වර්ෂය තුල ක්‍රියාකර තිබුණි. ලැබී ඇති තොරතුරු අනුව, කොළඹ සිට කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලට යාම සඳහා ගතවන ගමන් කාලය අඩුකිරීම සහ වරායේ සිට කොළඹ වෙනත් ප්‍රදේශයන්ට භාණ්ඩ ප්‍රවාහනයේ රථවාහන තදබදයට සහන සැලසීමෙන්, ආර්ථික කටයුතු වලට ධනාත්මක බලපෑමක් ඇති කිරීම හා ප්‍රාදේශීය පළාත් මාර්ග එකට එකතුවීම මෙයින් අපේක්ෂා කරයි. මහාමාර්ගයේ බහාලුම්වල සංචලනයන් අඩුකිරීම තුලින් කොළඹට තදාසන්න ප්‍රදේශවල රථවාහන තදබදය අවම කිරීමත් අපේක්ෂා කරයි. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.බිලියන 36.5 ක් විය. ව්‍යාපෘතියේ කටයුතු 2016 පෙබරවාරි මාසයේ ආරම්භකල අතර 2016 මාර්තු මස ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු 2020 මාර්තු මස නිම කිරීමට අපේක්ෂිතය.

**1.3** <u>**මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**</u>

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4** <u>**විගණකයේ වගකීම**</u>

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාරධර්ම වල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැළසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට අදාල විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත්වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වල දී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශන වල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත්වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකණු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුලත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන වැඩිදියුණු කල මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති වියදම සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සපයනු ලබන ලද අරමුදල් වලින් දරන ලද ව්‍යාපෘති වියදම, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් හා වගකීම්, ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව,

(ඈ) සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව,

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඊ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව සහ,

(උ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වෙන කරුණු වලින් උද්ගතවන ගැලපීම් වලින් ඇතිවන බලපෑම් හැර මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

කොන්ක්‍රීට් කණුමත දිවෙන (Elevated) වරාය ප්‍රවේශ මාර්ග ව්‍යාපෘතියේ හා කණුමතින් ඉදිවන අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ (නව කැළණි පාලමේ සිට අතුරුගිරිය දක්වා) ව්‍යාපෘති කළමනාකරණ ඒකක වල කාර්යාල එකම පරිශ්‍රයක් තුල පිහිටුවා තිබුණත්, පොදුකාර්ය පිරිවැය වෙන් වෙන්ව හඳුනාගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. තවද, ඉහත සඳහන් ව්‍යාපෘති සඳහා එකම බැංකු ජංගම ගිණුමක් පවත්වාගෙන ගොස් තිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

2016 මාර්තු 10 පැවති රැස්වීමේදී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයෙන් අනුමැතිය ලබා ගත්තද, 2017 වර්ෂය සඳහා රේඛීය අමාත්‍යාංශයේ අයවැයෙන් වෙන් කරන ලද රු.මිලියන 200 හැර වෙනත් මූල්‍ය විධිවිධාන සලසාගෙන නොතිබුණි. ලැබී ඇති තොරතුරු අනුව, 2018 ඔක්තෝම්බර් මාසයේ ආසියානු සංවර්ධන බැංකුව සමඟ ණය ගිවිසුමකට එළඹීම සඳහා කටයුතු සංවිධානය කර තිබුණි. තවද,

වෙන්කිරීම් වලින් රු.මිලියන 154.70 ක් රේඛීය අමාත්‍යාංශයේ අනෙකුත් අරමුණු සඳහා මාරුකර තිබූ අතර වෙන් කිරීම් වලින් සියයට 12 ක් නියෝජනය වන රු.මිලියන 24.43 ක් පමණක් සමාලෝචිත වර්ෂය තුලදී උපයෝජනය කර තිබුණි.

**3.2 භෞතික ප්‍රගතිය**

ව්‍යාපෘතිය විසින් වෙන් කර ඇති සම්පත් භාවිතා කරමින් නියමිත කාල වකවානුව තුල ව්‍යාපෘතියේ අරමුණු ළඟාකරගැනීම සහතික වන පරිදි සහ මූල්‍ය හා භෞතික ඉලක්ක හා බැඳුනු වගකීම් ඉස්මතුවන ලෙස මාසික, කාර්තුමය, අර්ධවාර්ෂික ලෙස සම්පූර්ණ හා විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ක්‍රියාත්මකර නොතිබුණි. ලැබී ඇති තොරතුරු අනුව, ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් 2016 පෙබරවාරි මස ආරම්භ කර තිබුණද භූ ලක්ෂණ සමීක්ෂණ සැලසුම්, ශක්‍යතා අධ්‍යනයන් යටතේ වන වැඩ පමණක් 2017 දෙසැම්බර් 31 දිනට සිදුකර තිබුණි. තවද, ප්‍රමුඛ ප්‍රසම්පාදන සැලසුමට අනුව, කොන්ත්‍රාත් අධීක්ෂණය සඳහා උපදේශන සේවා සැපයීම සහ සිවිල් වැඩ යන මූලික ප්‍රසම්පාදන කටයුතු 2018 මැයි 31 වන විටත් අවසන් කර නොතිබුණි.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ භාවිතය සඳහා ව්‍යාපෘතිය විසින් ඉදිකිරීමට නියමිත මහල් දහහතකින් යුත් නව කාර්යල ගොඩනැගිල්ලක සහ කම්හල් හතරක සැලසුම් සකස් කිරීමට ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයෙන් උපදේශන සේවාවන් ලබා ගෙන තිබුණු අතර ඒ සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් 2017 අගෝස්තු 23 වන දින පැවති රැස්වීමේදී අනුමැතිය ලබා දී තිබුණි. නමුත්, 2018 ජුනි 30 වන විටත් ඒ පිළිබඳව විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණි.

**3.4 මානව සම්පත් කළමනාකරණය**

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් සේවා අනුමතකර ඇති කාර්ය මණ්ඩලය අනුව, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සේවා තනතුරු 21කින් සමන්විත වේ. එයින්, ප්‍රධාන තනතුරු වන ප්‍රධාන ඉංජිනේරු, ව්‍යාපෘති ඉංජිනේරු, ප්‍රසම්පාදන විශේෂඥ හා ප්‍රතිස්ථාපන නිලධාරී යන තනතුරු 2017 දෙසැම්බර් 31 තෙක් පිරවීමෙන් තොරව පැවතුණි. තවද, වැඩබැලීමේ පදනම මත පත්කල ව්‍යාපෘති අධ්‍යක්ෂ 2017 සැප්තැම්බර් 07 වන දින ඉවත්වී තිබුණු අතර එම තනතුර 2018 ජනවාරි 11 දක්වා පුරප්පාඩුව පැවතුණි.